# DEMAND, SUPPLY, ELASTICITY AND MARKET EQUILIBRIUM (Part-VI)

*S. Madushanka*

*B.Sc (Mgt) Accounting (Special) (U.G)*

*University of of Sri Jayewardenepura*

# ආදායම් ඉල්ලුම් නම්‍යතාව

පාරිභෝගික ආදායම වෙනස් වන විට එක් එක් භාණ්ඩ වර්ග සඳහා පවතින ඉල්ලුම වෙනස් වන ආකාරය එකිනෙකට වෙනස් ස්වරූපයක් ගනී.

ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී, පාරිභෝගික ආදායම් ප්‍රතිශත වෙනසකට සාපේක්ෂ ව සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රතිශතක වෙනස මැන දැක්වීම ආදායම් ඉල්ලුම් නම්‍යතාව වේ.

ClassWork.LK

# ආදායම් ඉල්ලුම් නම්‍යතාව මැනිය හැකි සූත්‍රය

Yed = සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රතිශතක වෙනස / ආදායමේ ප්‍රතිශතක වෙනස

$$Yed = \frac{\Delta^{Q}}{\Delta^{Y}} \quad X \quad \frac{Y}{Q}$$

$Yed$ = ආදායම් ඉල්ලුම් නම්‍යතාව

$\Delta^{Q}$ = ඉල්ලුම් වෙනස

$\Delta y$ = ආදායමේ වෙනස

$y$ = පළමු ව දී ඇති ආදායම

$Q$ = පළමු ආදායම යටතේ පැවති ඉල්ලුම

ClassWork.LK

# <u>ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය සහා භාණ්ඩ වර්ග</u>

ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන අගයක් ගනු ලබන්නේ ආදායමේ වෙනස හා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමේ වෙනස අතර අනුලෝම සම්බන්ධයක් පවතින භාණ්ඩවල ය.

එහි ධන සම්බන්ධතාවක් පවතින්නේ **සාමාන්‍ය භාණ්ඩවල** ය.

ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන එකට වැඩි අගයක් ගනු ලබන්නේ ආදායම් ප්‍රතිශතක වෙනසට වඩා වැඩි ප්‍රතිශතයකින් සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම වැඩි වන විට දී ය.

ආදායම් ඉල්ලුම් නම්‍යතා ධන අගය එකට වැඩි අගයක් ගන්නේ **සුබෝපභෝගී භාණ්ඩවල** ය.

ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන එකට අඩු අගයක් ගනු ලබන්නේ ආදායමේ ප්‍රතිශතක වෙනසට වඩා අඩු ප්‍රතිශතයකින් සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම වැඩි වන විට දී ය.

ආදායම ඉල්ලුම් නම්‍යතාව ධන අගය එකට අඩු වන්නේ **අත්‍යවශ්‍ය භාණ්ඩවල** ය.

ClassWork.LK

ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය සෘණ අගයක් ගනු ලබන්නේ ආදායමේ වෙනස හා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුමේ වෙනස අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතින විට දී ය. ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය සෘණ අගයක් ගන්නේ **බාල භාණ්ඩවල** ය.

ClassWork.LK

## ආර්ථික විග්‍රහයන් සඳහා ආදායම් ඉල්ලුම් නම්‍යතාව යොදාගත හැකි ආකාර

අත්‍යවශ්‍ය භාණ්ඩ, සුඛෝපභෝගී භාණ්ඩ හා බාල භාණ්ඩ යනුවෙන් වර්ග කිරීමට

ආදායම් වෙනස් වීම මත වෙළෙඳපොළේ භාණ්ඩවලට ඇති ඉල්ලුම වෙනස් වන ආකාරය පුරෝකථනය කිරීමට

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura